**බද්දේගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 22 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බද්දේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ප්‍රතිපාදන ඇතිකළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් තබමි. |
| (ආ) | බැංකුව විසින් ඉදිරිපත් කරන ලද ශේෂ සනාථ කිරීම් අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු ශේෂය රු.7,771,135 ක් වූ නමුත්, එය රු.7,934,659 ලෙස ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 ගිණුම මගින් නිවැරදි කරමි. |
| (ඇ) | ඉකුත් වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් හිඟ දායක මුදල් ශේෂය රු.6,440,016 ක් වුවත්, ගෙවීම් කර නොතිබිය දී සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,891,494 ක් ලෙස ගිණුම් වල දක්වා තිබුණි. | දායක මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සංශෝධිත වාර්තාව අනුව ඉදිරියේදී නිවැරදි කරමි. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.68,651,798 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කාලයක සිට පවතින අසමාන -තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ලැබිය යුතු ගිණුම්** | | |
| ඉකුත් වර්ෂ වලට අදාල රු.43,655,577 ක් වූ ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නො කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 158,484,775ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම්**

---

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| (i) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්ත හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශනයන් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී රීති ප්‍රකාරව කටයුතු කර නිවැරදි කරමි. |
| (ii) රීති 217 හා 218 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණු අතර, අංක පී.එස්. 46 දරන ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් ද පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී රීති ප්‍රකාරව කටයුතු කර නිවැරදි කරමි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) මුදල් රෙගුලාසි 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනය විසින් පෙන්වා දීමෙන් පසු පිටපත් ඉදිරිපත් කර ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | වාහන 06 කට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව ධාවන සටහන් ඉදිරිපත් කරමි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතුව පැවති වාහන 14 කට අදාළව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) 1992 අගෝස්තු 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/92 | සභාව සතු වාහනවල රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,447,239 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,803,317 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,064,613 | 3,211,740 | 2,869,490 | 7,547,094 | 2,733,661 | 3,320,053 | 1,355,819 | 7,206,728 |
| කුලී | 7,683,200 | 3,319,320 | 3,303,250 | 422,706 | 1,179,100 | 3,008,795 | 2,921,820 | 413,657 |
| බලපත්‍ර ගාස්තු | 1,245,550 | 1,415,700 | 1,420,450 | - | 1,175,000 | 1,369,680 | 1,364,930 | 4,750 |
| | 11,993,363 | 7,946,760 | 7,593,190 | 7,969,800 | 5,087,761 | 7,698,528 | 5,642,569 | 7,625,135 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **වරිපනම්**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් බදු ආදායම රු.7,528,161 ක් වූ ඉහළ අගයක් ගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.2,170,538 ක් හා මුද්දර ගාස්තු රු.98,464,022 ක් විය. ප්‍රධාන ලේකම් කාර්යාලයේ වාර්තා අනුව සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිවෙලින් රු.2,292,511 ක් හා රු.1,321,123 ක් විය. | ප්‍රධාන ලේකම්ගේ තොරතුරු අනුව ගිණුම් නිවැරදි විය යුතුවේ. | ප්‍රධාන ලේකම්ගේ තොරතුරු පිළිබඳ එකඟත්වයක් නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | සැලැස්මක් සකස් කර ඇති බවත්, ඉදිරියේදී සැලසුම් ක්‍රියාවට නංවමි. |

**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | කසළ බැහැර කිරීම සඳහා පරිසර බලපත්‍රයක් ලබාගත යුතුවේ. | ඉදිරියේදී විධිමත් පරිදි කසළ කළමනාකරණය සිදු කිරීමට කටයුතු කරමි. |

(ඇ) **ඉටු නොකල කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 වර්ෂයේ උපමානපාදක ප්‍රතිපාදන යටතේ ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා රු.4,500,000 ක මුදලක් අනුමත වී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පවරාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුවේ. | නීතිමය කටයුතු අවසන් වන තුරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොහැකි බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වාහන උපයෝජනය** | | |
| සභාව සතුව පැවති වාහන 02 ක් ධාවන තත්ත්වයේ නොපවතින අතර, ට්‍රේලර් 02 ක් දිරාපත් වෙමින් පැවතුණි. | අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරී නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අතිරික්ත සේවක සංඛ්‍යාව 15 ක් වූ අතර, පුරප්පාඩු සංඛ්‍යාව 07 ක් විය. | පුරප්පාඩු පුරවා ගැනීමට, අතිරික්ත තනතුරු විධිමත් කිරීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සඳහා අනුමැතියට යවා ඇත. |
| (ආ) | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 25/2014 ට අනුකූල නොවන පරිදි අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් 13 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා දීමනා වශයෙන් රු.3,114,331 ක් වැයකර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සේවා අවශ්‍යතාවය මත බඳවා ගැනීම් සිදුකර වැටුප් ගෙවා ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරී නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු අක්කර 02 පර්චස් 14.4 ක විශාල ලේල්වලවත්ත පන්විල ඉඩම පවරා ගැනීම සඳහා රු.2,044,000 ක් ගෙවා තිබුණ ද, පවරා ගැනීම් සිදුව නොතිබුණි. | ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | නීතිමය කටයුතු ආරම්භ කර ඇති බව දන්වමි. |
| (ii) | මාකුරුගොඩවත්ත ඉඩම සතිපොල ඉදිකිරීම, කසළ අංගනයක් ඉදිකිරීම හා නගර ශාලාව ඉදිකිරීමට ඉඩම් පවරා ගැනීමට අදාල රු.500,000 ක මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ගෙවා තිබූ නමුත්, ඉඩම පවරා ගැනීම සිදුව නොතිබුණි. | ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පවරාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුවේ. | මේ වන තුරු ඉඩම පවරා ගැනීමට නොහැකි වී ඇත. |

### 3.4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඝණ අපද්‍රව්‍යය ගබඩා කිරීමට රු.156,455 ක් වැයකර ඉදිකළ ගොඩනැගිල්ල ප්‍රයෝජනයට නොගෙන තිබූ අතර, මීට පෙර ඉදිකළ ගොඩනැගිල්ල ද කිසිම කටයුත්තක් සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. | නිෂ්ක්‍රීය ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමි. |
| (ආ) සභාව සතු හාඩ්මෙක් රථය හා ජේ.සී.බී. යන්ත්‍රය නිෂ්ක්‍රීයව පැවතුණි. | අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කල යුතුවේ. | අළුතින් කාර්යය මණ්ඩලය අනුමත කර ගැනීමෙන් පසු සුදුසු නිලධාරියෙකු පත්කර අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරමි. |